# තම වාසියට අනුන් නසන්නට තනන්නෝ




දැන් මේ දවස්වල ලංකාවේ දේශපාලනය දිහා බලන කොට දකුණේ දේශපාලනඥයන් සියල්ලම උතුරේ යුද්ධයේ ජයග්‍රහණය සතුට භුක්ති විඳින බව පේනවා. සතුට කොහොමද කියල කිව්වොත් ජයග්‍රහණය බෙදා ගන්න බැරිව එකාට එකා කපා ගන්නවා. පරාජයේදී ඇඟ බේරාගෙන එක පිලකට පමණක් කොක්ක දාන අපේ මිනිස්සුන්ගේ හැසිරීම දිහා බලනකොට ඒ වාසියත් නැවතත් ලැබෙන්නෙ උතුරටම තමයි.

ආණ්ඩුව පිහිටුවන්න ප්‍රබල කොටස්කාරයෙක් විදිහට හවුල් වුනු ජනතා විමුක්ති පෙරමුණ අද විශාල අර්බුදයකට, විවේචනයකට අසුවෙලා. ඒ කටට එන ඕනෙම දෙයක් දෙසාබාන සෝමවංශ අමරසිංහ නායකතුමා නිසා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලෝකයේ පැරණිම වෘත්තියේ යෙදෙන බව පවසමින් ඔහු අද කට වරද්දගෙන අනාගෙන තියෙනවා.

ඇත්තටම බැලුවොත් අපේ රටේ ප්‍රබල පක්ෂ දෙකම දේශපාලනයේදී ගණිකා වෘත්තියේ යෙදුනා. බලය රැකගන්න, ලබාගන්න නොයෙක් නොයෙක් අවස්ථාවල ඔවුන් ඒ කාර්යය ලස්සන්ට කලා. නමුත් මේ ප්‍රබල පක්ෂ දෙක සමගම සංවාසයේ යෙදෙන්නට ගිය වාමාංශික පක්ෂ බොහොමයක් සමාජ රෝග සදාගෙන එක්කො මිය ගියා. නැත්නම් පණ අදිනවා. ලංකා සම සමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය එදා ප්‍රබල පක්ෂ අද ඒ සමාජ රෝගවලින් බොහෝදුරට මිය ගිහින්. මං හිතන්නෙ ජනතා විමුක්ති පෙරමුණටත් ඒ දේම තමයි සිද්ද වෙන්න යන්නෙ. ඔවුන් දෙවරක්ම ශ්‍රීලනිපය බලයට පත් කරන්න උදව් කලා. එක්වරක් චන්ද්‍රිකාට, ඊළඟට මහින්දට. ඒ දෙපාරම ජනතා විමුක්ති පෙරමුණ සංවාසයේ යෙදුනෙ තමන්ගේ අභිමතාර්ථ ඉෂ්ඨ කර ගන්න. ඊළඟට ඔවුන් තමන්ගේ ප්‍රතිපත්ති පවා පාවාදීලා ජාතිවාදී පක්ෂයක් වුණොත් ඒ අහුබුලු වලින් තමන්ට බලයක් ගොඩනගා ගන්න. අන්තිමට චන්ද්‍රිකාට විරුද්ධ වෙලා, ඇයගේ ප්‍රධාන හතුරා වෙලා කඩු හරඹ කරපු ඔවුන් මහින්දට ජැක් එක ගැහුවෙත් ඒ දේටමයි.

අද මේ දේවල්ම එදා ඇන්. ඇම්ලා, කොල්වින්ලත් සිද්ද කර ගත්තා. වරක් කොල්වින් ජේ.ආර්. බලයට පත් කරන්න යූ.ඇන්.පිය සමග රහසිගතව සංවාසයේ යෙදුනා. නමුත් ඇන්.ඇම්. කැපිල ගියේ ඇත්තටම යමක් කරන්න ගිහිල්ලා ගණිකාවන් සමඟ හෝ එකතු වුනේ යමක් කරන්න. අන්තිමට ඇන්. ඇම්ල මියගියේ ඒ හිත් අමාරුවලින්.

එදා ඒ මිනිසුන් අතේ බල අරගල නොතිබුණා නම් අද අපේ රටේ දෙවෙනි බලවේගය වෙන්නෙ සම සමාජයයි. එහෙනම් අද තියෙන්නෙ බණ්ඩාරනායක යුගය නොවෙයි. වෙන යුගයක්.

අද රාජපක්ෂලට ගිය ශ්‍රීලනිපයේ මහින්දත් ධනේෂ්වර පුත්‍රයෙක්. ඒ බව දැන දැනම තමයි ජේ.වී.පී. ය සංවාසයේ යෙදුනෙ. මහින්දට ජනතා විමුක්ති පෙරමුණට වැඩිය යූ.ඇන්.පී.ය අද විශ්වාසයි. ඒ පක්ෂ දෙකම ධනේෂ්වර පංතියේ අනුගාමිකයන්. ඉටුකල යුත්තේ ඒ අවශ්‍යතා. දැන දැනම සංවාසයේ යෙදුන ජේ.වී.පී. ය අද ප්‍රබල පීඩනයකට අසුවෙලා. ඒ බව නන්දන ගුණතිලකගේ වෙන්වීමෙන් පවා හිතාගන්න පුළුවන්. මේ යන විදියට ජේ.වී.පී. ය ඉදිරියේදී යූ.ඇන්.පීයත් බලයට පත් කරන්න අනිවාර්යයෙන්ම උදව් කරනවා. ඒක වලක්වන්න බැහැ. නොබෝ කලකින් ඒ දේත් සිදුවෙයි.

අද උතුරේ යුද්ධය දිහා බලන කොට ආණ්ඩුවට ඕනෙ ප්‍රභාකරන්ගෙන් වචනයක්. ඒ කියන්නෙ මිනි මරන්නෙ නැහැ කියන සහතිකය. සමහර විට පසුබා සිටින ප්‍රභාකරන් ඒ සහතිකය ලබාදේවි. ඒත් දකුණේ වෙන සමහර මිනීමැරුම් මහින්දට නතර කරන්න බැරුවා සේම ප්‍රභාකරන්ටත් බැරිවෙයි තමන්ගේ අනුගාමිකයන් මරන ඒවා නතර කරන්න.

අද උතුරේ යුද්ධය දිහා බලන කොට ආණ්ඩුවට ඕනෙ ප්‍රභාකරන්ගෙන් වචනයක්. ඒ කියන්නෙ මිනි මරන්නෙ නැහැ කියන සහතිකය. සමහර විට පසුබා සිටින ප්‍රභාකරන් ඒ සහතිකය ලබාදේවි. ඒත් දකුණේ වෙන සමහර මිනීමැරුම් මහින්දට නතර කරන්න බැරුවා සේම ප්‍රභාකරන්ටත් බැරිවෙයි තමන්ගේ අනුගාමිකයන් මරන ඒවා නතර කරන්න. රහසිගතව යටින් මැරෙන ඒව කාගෙ ලැයිස්තුවට වැටෙයිද කියල කවුරුවත් දන්නෙ නැහැ. එදා රෝහණ විජේවීරටත් ඒ දේම සිද්ධ වුණා. අන්තිමට ඔක්කොම බැරවුණේ විජේවීරගේ ගිණුමට. එදා විජේවීරගේ සේම අද ප්‍රභාකරන්ගේ යුගයේ කෙරෙන්නේත් රටේ ජනගහනය අඩු කරන එක විතරයි. 60,000 ක් විතර බිල්ලට ගිය දකුණේ යුද්ධයෙන් තරුණයන් සේම ජේ.වී.පී.ය ලබාගත්ත දෙයක් නැහැ. සිද්ධ වුණේ තමන්ගෙ කීපදෙනෙක් පාර්ලිමේන්තුවට යවාගත්ත එක විතරයි. මේ දෙගොල්ලොම කලේ ධනේෂ්වර පන්තියේ වුවමනාවක් වෙනුවෙන් රටේ ජනගහණය අඩු කරපු එක විතරයි. අද දකුණේ තරුණයන් තරමක් දුරට ඒ දේ තේරුම් ගත්තත්, උතුරේ තරුණයන් තවමත් ඒ උගුලේ අසුවෙලා. එක්කො බලෙන් අසුකරලා. ඉදිරියේදී බලෙන් වුනත් අසු කරගන්න තරුණයෝ ඔවුන්ට නැහැ.

ඉතින් මේ සියලු දේවල් දිහා ඇසිපිය නොහෙලා බලා සිටින කොට ජාතක කතා සංග්‍රහයේ එන සාලිය ජාතකයෙන් වැදගත් උපදේශයක් ලබා දෙනවා. ඒ තමන්ගේ වාසිය වෙනුවෙන් අනුන් නසන්නට කවර උපක්‍රමයක් හෝ යොදන්නා එම උපායටම අසුවී නැසී යන බවයි.

5 වන පිටෙන්

එහෙත් දිනය සම්බන්ධයෙන් රජය නම්‍යශිලීව කටයුතු කිරීම රජය නම් කළ ස්ථානයට එම සංවිධානය එකඟවීම සඳහා පෙළඹවීමක් වූ බවද නිසැකය.
රජය සතුව ඇති සියළු වාසිදායක තත්ත්වයන් සාකච්ඡා කළයුතු මාතෘකා එල්.ටී.ටී.ඊ. යට පිළිගැන්වීමට සමත් වූ බවද නිසැකය. ඒ අනුව අවසන් දේශපාලන විසඳුමක් ඇතිකර ගැනීමේදී වැදගත් වන කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට හැකවීම සැලකිය යුතු ප්‍රගතියක්ද වන්නේය. එල්.ටී.ටී.ඊ. සංවිධානය මෙවන් එකඟතාවයකට පැමිණියත් එය කැමැත්තෙන් සිදුවූවක් නොවන්නටද ඇත. එය අවස්ථාවට මුහුණදීමට සිදුවීමක්ද විය හැකිය. එබැවින් දෙපාර්ශවය අතර සාකච්ඡා ඇරඹීමට පෙර පවත්නා එම තත්ත්වයන් වෙනස් කිරීමට ඔවුන්ට වාසිදායක තත්ත්වයන් නිර්මාණය කර ගැනීමට ගතහැකි සෑම උත්සාහයක්ම දැරීමට ඔවුන් පෙළඹෙනු ඇත. සැලසුම් සැකසීමට ඉඩ ඇත. රජයද ඒ පිළිබඳව විමසිලිමත්ව තීක්ෂණ බුද්ධියෙන් යුතුව කටයුතු කළ යුතුව ඇත.

*සාකච්ඡා මේසයේදී එල්.ටී.ටී.ඊ. ය හමුවනතුරුම මේ මොහොතේ රජය වඩාත් උපක්‍රමශිලී, කල්පනාකාරී මෙන්ම සැලසුම් සහගත විය යුතුව ඇත.*

සාකච්ඡා මේසයේදී එල්.ටී.ටී.ඊ. ය හමුවනතුරුම මේ මොහොතේ රජය වඩාත් උපක්‍රමශිලී, කල්පනාකාරී මෙන්ම සැලසුම් සහගත විය යුතුව ඇත. එය තවදුරටත් තහවුරු කර ගනිමින් සාකච්ඡා ප්‍රවේශය ඉදිරියට ගෙනගොස් ස්ථිර දේශපාලන විසඳුමක් සොයා ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමේදී ඇති වියහැකි බාධක මුහුණුදීමට සිදුවන අභියෝග පිළිබඳව මේ මොහොතේ සිටම අවධානය යොමුකර සැලසුම් සකසමින් කටයුතු කළ යුතුව ඇත. එකඟතාවයන්ගේ ප්‍රතිඵල ලබාගත හැක්කේ එසේ වුවහොත් පමණි.

වසර පහක් සපුරණ
ලක් හඬ
FM 97
ගුවන් විදුලියට
සන්නසෙන්
සහෝදරාත්මක සුබ පැතුම්

Minimize your Vehicle Maintenances.......
with our Superior Vehicle Protection Services

**Our Vehicle Protection Services Include:**
- CRYSTAL GLAZE PAINT PROTECTION
- INTERIOR PROTECTION
- INSTALL RUST CONTROL UNITS
- WINDOW TINTING

We Provide Quality, Reliable and Affordable Vehicle ProtectionServices

Contact : 0412 037 615
**JI Automotive Services**
5/63 Lonsdale Street Dandenong VIC 3175
Telephone : 03 9755 5974

U.D. Electricals
ඔබේ සියළුම ගෘහ විදුලි අවශ්‍යතා සඳහා
බලයලත් විදුලි ශිල්පි
Registered Electrical Contractors and Licenced Electrician (Rec 17240)
Down lights, Power points,
Sensor lights, Exhaust fans,
Heter lights, Safty switches,
Upgradig fuse boards
All Electrical Work
Call Upali 0422 052 425/ 03 97056697
Narre Warren
Reasonabe Rates + All Work Gurenteed